# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

දුරකථන / ෆැක්ස් : 2556629 ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/145/20 ඔබේ අංකය :

2019.08.28

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා,
සහයක සේවා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**කුණ්ඩසාල පොලිස් රෝහලෙහි පවත්වාගෙන යනු ලබන පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන්ගේ වාට්ටුවෙහි සංවර්ධනය සහ අඩුපාඩු.**

කුණ්ඩසාල පොලිස් රෝහලෙහි පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නේවාසික ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වාට්ටු සංකීර්ණයේ පවතින අඩුපාඩු සම්බන්ධයෙන් ස්ථානාධිපති කුණ්ඩසාල පොලිස් රෝහල විසින් අප සංගමය වෙත ලිඛිතව දන්වා ඇත. (එම ලිපියේ පිටපතක් මේ සමග අමුණා ඉදිරිපත් කරමි)

ඒ අනුව එම වාට්ටුවේ නේවාසිකව ප්‍රතිකාර ලබාගන්නා පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන්ගේ සුභසාධනය වෙනුවෙන් මෙම වාට්ටුව සඳහා පහත සඳහන් උපකරණ ලබා ගැනීමට අවශ්‍ය බව සඳහන් කර ඇත.

- කුඩා ශීත කරණ 01 ක්
- මයික්‍රොවේව් අවන් 01 ක්.

කරුණු එසේ හෙයින් කුණ්ඩසාල පොලිස් රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබාගන්නා නිලධාරීන්ගේ ඉල්ලීම මත ස්ථානාධිපති කුණ්ඩසාල පොලිස් රෝහල විසින් කර ඇති ඉල්ලීම අනුව ඉදිරියේදී පොලිස් රෝහල මගින් නේවාසිකව ප්‍රතිකාර ලබාගන්නා නිලධාරීන්ගේ සුභසාධනය වෙනුවෙන් ඉහත සඳහන් උපකරණ ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

ප්‍රගීත් ප්‍රේමසිරි,
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

ගරු ලේකම්
පොලිස් පරීක්ෂක සංගමය